# ශ්‍රී ලංකා කජු සංස්ථාව - 2012

## 1. මූල්‍ය ප්‍රකාශන

### 1.1 තත්ත්වාගණනය කළ මතය

මෙම වාර්තාවේ 1.2 ඡේදයේ දක්වා ඇත කරුණු වලින් වන බලපෑම හැර 2012 දෙසැම්බර් 31 දිනට ශ්‍රී ලංකා කජු සංස්ථාවේ මූල්‍ය තත්ත්වය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා එහි මූල්‍ය ක්‍රියාකාරිත්වය හා එහි මුදල් ප්‍රවාහ සත්‍ය හා සාධාරණ ලෙස දැක්වෙන අයුරින් ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිතවලට අනුකූලව මූල්‍ය ප්‍රකාශන පිළියෙල කර ඇති බව මා දරන්නා වූ මතය වේ.

### 1.2 මූල්‍ය ප්‍රකාශන පිළිබඳ අදහස් දැක්වීම

#### 1.2.1 ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිත

පහත දැක්වෙන ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිතවලට අනුකූල නොවීම් විගණනයේදී නිරීක්ෂණය විය.

(අ). ශ්‍රී.ලං.ගි.ප්‍ර.01 විස්තීර්ණ ආදායම් ප්‍රකාශනය නියමිත ආකෘති රාමුවට අනුව ඉදිරිපත් කර නොතිබුණි.

(ආ). ශ්‍රී.ලං.ගි.ප්‍ර.02 තොග අගය කිරීමේදී පිරිවැය සහ ශුද්ධ උපලබ්ධි අගය යන දෙකෙන් අඩු අගය යොදාගත යුතු වුවත් කජු අලෙවිසැල්වල සහ පිරිසැකසුම් මධ්‍යස්ථානවල සම්පූර්ණයෙන් නිමවූ කජු මද තොගයේ පිරිවැය සහ ශුද්ධ ලබ්ධි අගය ගණනය කිරීමෙන් තොරව විකුණුම් මිලෙන් 80% ක් පිරිවැය ලෙස දක්වා තිබුණි. එමෙන්ම 90% ක් සහ 75% ක් දක්වා නොනිමි කජු මද තොගයද ඉහත පිරිවැයට අනුපාතිකව ගණනය කර තොග අගය කර තිබුණි.

(ඇ). ශ්‍රී.ලං.මු.වා.ප්‍ර.01 මූල්‍ය තත්ත්ව ප්‍රකාශනය පිළියෙල කිරීමේදී ඉඩම් සහ වාහන හැර අනෙකුත් ස්ථාවර වත්කම් නැවත අගය කිරීමෙන් තොරව පිරිවැයෙන් සමුච්චිත ක්ෂය අඩුකළ අගයට දක්වා තිබුණි. ආයතනයේ බාහිර කාර්යාල හා ස්ථාවර වත්කම් විශාල සංඛ්‍යාවක් ඇති හෙයින් ඒවා එකවර ප්‍රත්‍යාගණනය කිරීම ඉතා අපහසු බව සභාපති දැනුම් දී ඇත.

(ඇ). ශ්‍රී.ලං.ගි.ප්‍ර.16 (i). ප්‍රත්‍යාගණිත අගයට ප්‍රකාශ කර ඇති ඉඩම් සහ වාහන සම්බන්ධව හෙළිදරව් කළ යුතු දෑ හෙළිදරව් කර නොතිබුණි.

(ii). නැදගමුව හා පුත්තලම් පිරිසැකසුම් මධ්‍යස්ථාන හැර අනෙකුත් වගාවන් සහිත වතුයායන්වල නීත්‍යානුකූල අයිතිය සංස්ථාවට නොමැති වුවත් එම වතුවල ප්‍රත්‍යාගණිත වටිනාකම ලෙස රු.3,083,279,850 ක් ගිණුම්වල දක්වා තිබුණි. කෙසේ වෙතත් මෙම වතුයායන් 1973 සිටම කජු වගාවසඳහා රජයෙන් ලබාදී ඇති බව සභාපති දැනුම් දී ඇත.

(iii). ඉඩම්, ගොඩනැගිලි සහ වාහන හැර අනෙකුත් ජංගම නොවන වත්කම් වලින් 57% ක් පමණ වූ පිරිවැය රු.18,752,624 ක් වන වත්කම් සම්පූර්ණයෙන් ක්ෂය කර ඇති නමුත් සංස්ථාව විසින් තවදුරටත් පරිහරණය කරන එම වත්කම් නැවත අගය කිරීමට කටයුතු කර නොතිබුණි.

(ඉ). ශ්‍රී.ලං.ගි.ප්‍ර.18 සේවක ණය පොළී ආදායම් සඵලදායි පොළී අනුපාතිකය අනුව හඳුනාගෙන නොතිබුණි.

(ඊ). ශ්‍රී.ලං.ගි.ප්‍ර.19 (i). පාරිතෝෂික සඳහා වෙන්කිරීම් ආයු ගණක තක්සේරුකරුවකු ලවා තක්සේරු කරගනිමින් ආයු ගණක ලාභ පාඩු හඳුනාගැනීමට කටයුතු කර නොතිබුණි.

(ii). පාරිතෝෂික අරමුදල ආයෝජනය කිරීමට කටයුතු කර නොතිබුණි.

(උ). ශ්‍රී.ලං.ගි.ප්‍ර.41 කජු සංස්ථාව සතු ජීව විද්‍යාත්මක වත්කම් මෙම ප්‍රමිතිය ප්‍රකාරව ගිණුම්ගත කිරීම් සහ හෙළිදරව් කිරීම් කර නොතිබුණි.

### 1.2.2 ගිණුම්කරණ ප්‍රතිපත්ති

ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිත 01 ප්‍රකාරව ව්‍යාපාරයක් විසින් මූල්‍ය ප්‍රකාශන සකස්කිරීමේදී සහ ඉදිරිපත් කිරීමේදී භාවිතා කරන ලද සියලු වැදගත් ගිණුම්කරණ ප්‍රතිපත්තිවල සාරාංශයක් හෙළිදරව් කළ යුතු වුවත් පහත සඳහන් ප්‍රතිපත්තීන් හෙළිදරව් කර නොතිබුණි.

(අ). අයභාර හඳුනාගැනීම
(ආ). දේපළ, පිරියත හා උපකරණ මිනුම්කරණය

### 1.2.3 ගිණුම්කරණ අඩුපාඩු

පහත අඩුපාඩු නිරීක්ෂණය විය.

(අ). ප්‍රාග්ධන ප්‍රදානවලින් දරන ලද වියදම් තුළ රු.426,876 ක් වූ ස්ථාවර වත්කම් ක්ෂයවීම් ඇතුළත් වී තිබුණි.

(ආ). 2011 වර්ෂයේදී ව්‍යාප්ති අංශය, බීජ උද්‍යාන සහ පර්යේෂණ හා සංවර්ධන අංශය වෙත කප්පු පැළ 255,369 ක් රු.20,231,507 ක පිරිවැයට මාරුකර තිබුණද කප්පු පැළවල සත්‍ය පිරිවැය රු.9,756,271 ක් වීමෙන් රු.10,475,236 කින් 2011 වර්ෂයේ ලාභය වැඩියෙන් හෙළිදරව් කිරීම සමාලෝචිත වර්ෂයේදී නිවැරදි කර නොතිබුණි.

### 1.2.4 ලැබිය යුතු හා ගෙවිය යුතු ගිණුම්

සමාලෝචිත වර්ෂය අවසානයේදී 2010 වර්ෂයට පෙර සිට ඉදිරියට එන බාහිර ණයගැති ශේෂය රු.2,003,354 ක් විය. එම ණය ආපසු අයකර ගැනීමේ ප්‍රගතිය දුර්වල මට්ටමක පැවතුණි.

### 1.2.5 නීති රීති, රෙගුලාසි හා කළමනාකරණ තීරණවලට අනුකූල නොවීම

නිරීක්ෂණය වූ නීති රීති, රෙගුලාසි හා කළමනාකරණ තීරණවලට අනුකූල නොවීම් පහත දැක්වේ.

| නීති රීති රෙගුලාසි වලට යොමුව | අනුකූල නොවීම පිළිබඳ විස්තර |
| --- | --- |
| (අ). 1958 අංක 15 දරන සේවක අර්ථසාධක අරමුදල් පනත සහ 1980 අංක 46 දරන සේවා නියුක්තිකයන්ගේ භාර අරමුදල් පනත | සේවක භාරකාර අරමුදලට හා සේවක අර්ථ සාධක අරමුදලට දායක මුදල් ගෙවීමේදී ජීවන වියදම් දීමනාව හා විශේෂ ජීවනාධාර දීමනාව සහිත වැටුප මත දායක මුදල් ගණනය කළ යුතු වුවත් ඊට පටහැනිව මූලික වැටුප පදනම් කරගෙන දායක මුදල් ගණනය කිරීම නිසා සමාලෝචිත වර්ෂයේදී දායක මුදල් රු.3,248,394 ක් අඩුවෙන් ගෙවා තබුණි. |
| (ආ). 2003 ජූනි 02 දිනැති රාජ්‍ය ව්‍යාපාර චක්‍රලේඛ අංක පි.ඊ.ඩී.12/8.3.5 (අ) | සභාපතිවරයාගේ නිලවාහනයට අමතරව රු.40,000 ක් බැගින් මාසික කුලියක් ගෙවමින් කුලී වාහනයක්ද ඔහුගේ පරිහරණය සඳහා ලබාදී තිබුණි. |

## 2. මූල්‍ය සමාලෝචනය

### 2.1 මූල්‍ය ප්‍රතිඵල

ඉදිරිපත් කරන ලද මූල්‍ය ප්‍රකාශන අනුව 2012 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා ආයතනයේ වැඩකටයුතු වලින් රු.44,233,831 ක අතිරික්තයක් වූ අතර ඊට අනුරූපීව ඉකුත් වර්ෂයේ අතිරික්තය රු.20,448,951 ක් විය. ඒ අනුව ඉකුත් වර්ෂය හා සසඳන විට සමාලෝචිත වර්ෂයේ දී රු.23,784,880 ක අතිරික්ත වැඩිවීමක් නිරීක්ෂණය විය.දිවිනැගුම ව්‍යාපෘතිය යටතේ සමාලෝචිත වර්ෂයේ විකුණුම් ආදායම රු.35,608,145 කින් වැඩිවීම මෙම වර්ධනයට හේතු විය. සමාලෝචිත වර්ෂය තුළදී රජයේ ප්‍රදාන වශයෙන් රු.73,076,037 ක් ලැබී තිබුණු අතර, ඊට අනුරූපව ඉකුත් වර්ෂයේදී රු.81,255,721 ක් ලැබී තිබුණි.

### 2.2 විග්‍රහාත්මක මූල්‍ය සමාලෝචනය

ඉදිරිපත් කරන ලද මූල්‍ය ප්‍රකාශන අනුව 2012 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂයේ ආයතනයේ මූල්‍ය ප්‍රතිඵලය 2011 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂයේ පැවති තත්ත්වය හා සසඳා පහත දක්වා ඇත.

(අ). වාණිජ අංශය

| | වතු සහ අලෙවි අංශය | | | වාණිජ පැල තවාන් අංශය | | |
|---|---|---|---|---|---|---|
| | 2012 | 2011 | ආයදම් වැඩිවීම, (අඩුවීම) සහ වියදම් වැඩිවීම, (අඩුවීම) ප්‍රතිශතයක් ලෙස % | 2012 | 2011 | ආයදම් වැඩිවීම, (අඩුවීම) සහ වියදම් වැඩිවීම, (අඩුවීම) ප්‍රතිශතයක් ලෙස % |
| මුළු ආදායම් | 57,375,124 | 57,582,062 | (0.3) | 101,947,112 | 66,106,905 | 54 |
| මුළු වියදම් | 61,367,823 | 59,372,280 | 3 | 36,115,643 | 25,122,425 | 44 |
| මෙහෙයුම් ලාභය /( අලාභය) | (3,992,699) | (1,790,218) | 123 | 65,831,469 | 40,984,480 | 61 |

(ආ). සේවා අංශය

| | 2012 | 2011 | ආයදම් වැඩිවීම, (අඩුවීම) සහ වියදම් වැඩිවීම, (අඩුවීම) ප්‍රතිශතයක් ලෙස % |
|---|---|---|---|
| රජයේ ප්‍රදාන - ප්‍රාග්ධන | 16,890,069 | 33,630,222 | (50) |
| - පුනරාවර්තන | 58,580,000 | 50,000,000 | 17 |
| වාණිජ අංශයේ ලාභය | 61,838,770 | 39,194,262 | 58 |

| | | | |
|---|---|---|---|
| අනෙකුත් ආදායම් | 1,362,562 | 2,210,122 | (38) |
| | ----------------- | ----------------- | |
| මුළු ආදායම | 138,671,401 | 125,093,806 | 11 |
| සේවා අංශයේ මුළු වියදම | 94,437,570 | 104,585,656 | (10) |
| | ----------------- | ----------------- | |
| සමස්ත ශුද්ධ ලාභය | 44,233,831 | 20,448,950 | 116 |
| | ========== | ========== | |

(ඇ). වතු සහ අලෙවි අංශයේ මෙහෙයුම් අලාභය 2011 වර්ෂයට සාපේක්ෂව 123% කින් වැඩි වී තිබුණි.

(ඇ). උච්නැගුම වැඩසටහන සඳහා කජු පැල අලෙවි කිරීමෙන් සංස්ථාවේ විකුණුම් ආදායම 2011 වර්ෂයේදී සහ 2012 වර්ෂයේදී පිළිවෙලින් 59% කින් සහ 276% කින් වැඩි වී තිබුණි.

### 2.2.2 මූල්‍ය ව්‍යුහය

ඉදිරිපත් කරන ලද ගිණුම් අනුව 2012 දෙසැම්බර් 31 දිනට ආයතනයේ මූල්‍ය ව්‍යුහය 2011 දෙසැම්බර් 31 දිනට පැවති තත්ත්වය හා සසඳා පහත දක්වා ඇත.

| **සම්පත්** | **දෙසැම්බර් 31 දිනට** | | **වෙනස් වීමේ ප්‍රතිශතය** |
|---|---|---|---|
| | 2012 | 2011 | |
| | රු. | රු. | % |
| රාජ්‍ය ප්‍රදාන - ප්‍රාග්ධන | 34,959,185 | 258,821,820 | (86) |
| වෙනත් ආයතන ප්‍රදාන | 17,910,572 | 13,570,026 | 32 |
| ප්‍රාග්ධන සංචිත | 3,100,200,606 | 4,464,178,935 | (30) |
| දිගුකාලීන වගකීම් | 37,784,779 | 27,834,961 | 36 |
| ඉ/ලාභ අලාභ | 117,787,907 | (88,802,915) | 233 |
| | ------------------ | ------------------ | |
| | 3,308,643,049 | 4,675,602,827 | |
| | =========== | =========== | |
| **උපයෝජනය** | | | |
| ස්ථාවර වත්කම් | 3,141,510,372 | 4,509,793,519 | (30) |
| වගා ඉඩම් සඳහා වූ වියදම් | 51,601,489 | 107,039,021 | (52) |
| වෙනත් සුළු ව්‍යාපෘති | 707,535 | 739,277 | (4) |
| ශුද්ධ ජංගම වත්කම් | 114,823,653 | 58,031,010 | 98 |
| | ------------------ | ------------------ | |
| | 3,308,643,049 | 4,675,602,827 | |
| | =========== | =========== | |

## 3. මෙහෙයුම් සමාලෝචනය

### 3.1 කාර්ය සාධනය

ශ්‍රී ලංකා කජු සංස්ථාවසතු වතුයායන්හි කජු අස්වැන්න සහ කජු වගා ප්‍රදේශ සම්බන්ධ තොරතුරු පහත දැක්වේ.

| වතුයාය | නිෂ්පාදනය | නිෂ්පාදන පිරිවැය | කි.ග්‍රෑ.එකක පිරිවැය | මේරූ කජු ප්‍රදේශ | නොමේරූ කජු ප්‍රදේශ | වයස් මට්ටම් මේරූ | වයස් මට්ටම් නොමේරූ |
|---|---|---|---|---|---|---|---|
| | කි.ග්‍රෑ | රු. | රු. | හෙක්ටයාර් | හෙක්ටයාර් | අවු: | අවු: |
| පුත්තලම | 10,260 | 9,493,325 | 925 | 264.71 | 20.24 | 30 ට වැඩි | 5 ට අඩු |
| කමන්දළුව | 39,440 | 8,642,719 | 219 | 146 | 20 | 30 ට වැඩි | 5 ට අඩු |
| එළුවන්කුලම | 48,570 | 6,282,007 | 129 | 77 | 04 | 11 ට වැඩි | 5 ට අඩු |
| හාඩි | 5,850 | 999,884 | 171 | 70.85 | 10.12 | 30 ට වැඩි | 5 ට අඩු |
| නාලන්දා | 4,870 | 764,788 | 157 | 20.24 | 8.1 | 10 ට වැඩි | 5 ට අඩු |
| විලච්චිය | 1,600 | 183,347 | 114 | 7.28 | - | 10 ට වැඩි | - |
| මහඔය | - | - | - | - | 10.12 | - | 5 ට අඩු |
| එකතුව | 110,590 | 26,366,070 | 238 | 586.08 | 72.58 | | |

(i). සංස්ථාව සතු එළදරන හෙක්ටයාර් 586 ක් අතුරින් 82% වූ හෙක්ටයාර් 481 ක් අවු: 30 ට වැඩි එළදායි ජීව ආයුකාලය පසුකර තිබුණි.

(ii). කජු ගෙඩි කි.ග්‍රෑ.1 ක වෙළඳ පොළ වටිනාකම රු.270 ක් පමණ වුවත් පුත්තලම් වතුයායේ කජු ගෙඩි කි.ග්‍රෑ.1 නිෂ්පාදන පිරිවැය රු.925 ක් පමණ විය.

### 3.2 කළමනාකරණ අකාර්යක්ෂමතා

නිරීක්ෂණය වූ කරුණු පහත දැක්වේ.

(අ). 2012 වර්ෂයේදී මිරිප්පිටිල වතුයායේ කජු අස්වැන්න රු.64,822 ක් වටිනා කි.ග්‍රෑ.288 ක් විය. වර්ෂයේ පරිපාලන වියදම් හා ඍජු වියදම් රු.2,141,154 ක් වූයෙන් 2012 වර්ෂයේ මෙහෙයුම් අලාභය රු.2,076,332 ක් විය.

(ආ). පුත්තලම් වතුයායේ 2012 වර්ෂයේ ආදායම රු.2,962,981 ක් වුවත් ඍජු සහ පරිපාලන වියදම් රු.9,551,318 ක් වූයෙන් 2012 වර්ෂයේ මෙහෙයුම් අලාභය රු.6,588,067 ක් විය.

## 3.3 හඳුනාගන්නා ලද පාඩු

සමාලෝචිත වර්ෂයේදී කොන්ඩච්චි, මන්කර්නි සහ ලග්ගල වතුයායන්හි භෞතික පැවැත්මක් නොමැති ගොඩනැගිලි, උපකරණ, මේරූ ප්‍රදේශ වියදම් සහ නොමේරූ ප්‍රදේශ වියදම් ඉවත්කිරීමෙන් සහ මිරිජ්ජවිල වතුයාය, මිරිජ්ජවිල සංචාරක බංගලාව සහ මිරිජ්ජවිල විකුණුම් මධ්‍යස්ථානය රජයට පවරාගැනීම හේතුවෙන් එහි පැවැති ඉඩම්, ගොඩනැගිලි, මේරූ ප්‍රදේශ වියදම් සහ නොමේරූ ප්‍රදේශ වියදම් ඉවත්කිරීමෙන් රු.72,754,773 ක අලාභයක් ඇති වී තිබුණි. මෙම අලාභය තුළ මිරිජ්ජවිල සංචාරක බංගලාව රජයට පවරා ගන්නා බවට දැනුම්දී තිබියදීත් සමාලෝචිත වර්ෂයේදී සංචාරක බංගලාව අළුත්වැඩියාව සඳහා දැරූ රු.2,710,143 වියදමද ඇතුළත් වී තිබුණි.සංස්ථාවට පාලනය කළ නොහැකි සාධක හේතුකරගෙන මෙම අලාභය දැරීමට සිදුවූ බව සභාපති දැනුම් දී ඇත.

## 4. පද්ධති හා පාලන

විගණනයේදී නිරීක්ෂණය වූ පද්ධති හා පාලන අඩුපාඩු වරින් වර ආයතනයේ සභාපතිවරයා වෙත යොමුකරන ලදි. පහත සඳහන් පාලන ක්ෂේත්‍රයන් කෙරෙහි විශේෂ අවධානය යොමු විය යුතුය.

(අ). ආපසු ලැබෙන කජු භාරගැනීම

(ආ). කජු තොග ගබඩා කිරීම

(ඇ). වාහන පාලනය